**ජිනීවා සාකච්ඡා සඳහා සම්බන්ධ වුණු ආණ්ඩුවේ නියෝජිත පිරිසට ඇතුළත් වූ ආර්ථික කටයුතු පිළිබඳ ජනාධිපති උපදේශක අජිත් නිවාඩ් කබ්රාල් මහතා සමඟ ජිනීවා සාකච්ඡා සම්බන්ධව කළ කතාබහකි මේ.**

# 96% ක්ම සටන් විරාමය උල්ලංඝනය කළේ එල්.ටී.ටී.ඊ. ය යි

## ආර්ථික කටයුතු පිළිබඳ ජනාධිපති උපදේශක අජිත් නිවාඩ් කබ්රාල්

**ප්‍රශ්නය** : ජිනීවා සාකච්ඡා වටයට සම්බන්ධ වූවකු විදිහට මේ සාකච්ඡා පිළිබඳ ඔබේ තක්සේරුව මොනවගෙයිද?

**පිළිතුර** : මූලිකවම අවුරුදු 03 කට විතර පසුව තමයි රජය හා එල්.ටී.ටී.ඊ. ය අතර මෙවැනි සාකච්ඡාවක් පැවතුනේ. පැහැදිලිවම, අපේ රටේ හැමකෙනෙක්ම වගේ මේ ප්‍රශ්නය විසඳා ගැනීමට සාකච්ඡා පැවැත්විය යුතුය කියන තැන හිටියා. එතැනට ගිහිල්ලා, පිළිතුරක් ලබාගැනීම කෙසේ වෙතත්, ඒ සඳහා ප්‍රවේශයක් ඇති කර ගැනීමට වැදගත්ය කියන කාරණාය සම්බන්ධයෙන් කාටවත්ම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඒ වගේම එල්.ටී.ටී.ඊ. යත් එක්ක කථා කරන්න යත්දී යම් පදනමක් ඇතිව යනවාය කියන එක රජය තමන්ගේ ස්ථාවරය හැටියට ප්‍රකාශයට පත් කරලා තිබුණා. ඒ විදිහටම නව ප්‍රවේශයක් සහිතව, රජය මේ සාකච්ඡාවලදී තමන්ගේ ස්ථාවරය ඉතාමත් පැහැදිලි ලෙස මුල් අදියරේ දී පෙන්නලා දුන්නා. ඒ වගේම මේ සාකච්ඡාවෙන් අනතුරුව නිකුත් කරපු ඒකාබද්ධ නිවේදනය අනුව බලපුවාහමත්, මේ සාකච්ඡා යම් දුරකට ඵල දරලා තියෙනවාය කියන එක පැහැදිලියි. 2006 පෙබරවාරි 23 දායින් පස්සේ තිබුණු තත්ත්වයයි ඊට පෙර තිබුණු තත්ත්වයයි, අපි සංසන්දනය කෙරුවොතින්, අනිවාර්යයෙන්ම තිබුණ තත්ත්වයට වඩා තියෙන තත්ත්වය, යහපත් බව ඕනෑම කෙනෙකුට පිළිගන්න වෙනවා. ඒ නිසා සමස්ථයක් විදිහට, මේ සාකච්ඡාවෙන්, කිසියම් සුබවාදී ප්‍රතිඵලයක් ඇති වුණාය කියලා අපිට හිතන්නට පුළුවන්.

ප්‍රශ්නය : ඔබ ඔහොම කිව්වත්, සමාජගත වෙලා තියෙන අදහස තමයි, මේ සාකච්ඡා වලින්, වැඩි වාසියක් වුනේ එල්.ටී.ටී.ඊ. යටය කියන එක. ජිනීවා හිඳී ආණ්ඩුව ලබා ගත්ත කිසිවක් නැහැ කියලයි, බොහෝදෙනෙ-ක් කියන්නේ....

පිළිතුර : කිහිපදෙනෙක් ඔය අදහස මතුකළාට, ඒක නිවැරදි නැහැ. උදාහරණයක් හැටියට සාකච්ඡා අවසානයේ, නිකුත් කරපු නිවේදනයේ, ඝාතන, පැහැර ගැනීම් ප්‍රචණ්ඩ ක්‍රියා නැවැත්වීමට රජය හා එල්.ටී.ටී.ඊ. ය එකඟ වුණාය කියලා, තියෙනවා. පහුගිය අවුරුදු 04 සම්බන්ධව ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව නිකුත් කරපු වාර්තාවකට අනුව, සටන් විරාමය කඩ කළේ කවිද, කියන එක පැහැදිලිවම සඳහන් කොට තිබුණා. ඒ අනුව සමස්තයක් ලෙස 96% ක්ම සටන් විරාමය උල්ලංඝනය, කරලා තියෙන්නේ එල්.ටී.ටී.ඊ. ය. රජය විසින් කඩ කළාය කියලා කිවහැකි අවස්ථා තියෙන්නේ 4%යි. ඒවත් බරපතල අවස්ථා නෙමෙයි. ඒ වගේ තත්ත්වයක් ඇතුළේ ඝාතන ක්‍රියා, ප්‍රචන්ඩ ක්‍රියා නවත්වනවාය කියලා කිසියම් අළුත් ප්‍රවේශයකට රජයයි, එල්.ටී.ටී.ඊ. යයි එනවා නම් ඒක වැඩිය බලපාන්නේ 96% ක් කඩක-රපු එක්කෙනාටද? 4% ක් කඩ කරපු එක්කෙනාටද? ඒක වාසියක් නෙමෙයිද?

**ප්‍රශ්නය** : ලියවිල්ලකට එකඟ වූ පමණින්, ඔය තරම් එල්.ටී.ටී.ඊ. ය විශ්වාස කරන්න පුළුවන්ද? ඔවුන් මීට පෙරත්, මෙවැනි ලිඛිත එකඟතා ඕනෑතරම් කඩකොට තියෙනවා...

**පිළිතුර** : ඒක හොඳ තර්කයක්. ඒත් ඔය කියන විදිහට අපිට විකල්ප දෙකක් තියෙනවා. අවශ්‍ය නම් අපිට ඔවුන්ව විශ්වාස නැහැ කියලා නිකං ඉන්න පුළුවන්. ඒත් එහෙම නම් ඇයි, අපි සාකච්ඡාවලට ගියේ? මුළු ලංකාවම සාකච්ඡාවලට යා යුතුයි, කියලා කිව්වා. ලංකාවම එහෙම කියනවා නම්, කිසියම් දුරකට හෝ විශ්වාසය තැබිය යුතුයි කියලා බලපෑමක් එල්ල වෙනවා. බොහෝම පැහැදිලිවම අපි ජිනිවා බලා ගියේ යම්කිසි දෙයක් දිනා ගැනීමට හැකිවේය කියන විශ්වාසය ඇතුළෙයි. අපි 100% ක් කාටවත්ම විශ්වාස කළ යුතු නැහැ. එහෙම කළ යුතුත් නැහැ. එල්.ටී.ටී.ඊ. ය ගැන ඔබ කිව්ව විදිහට හිතන්න, යමෙකුට අයිතිය තියෙනවා වගේම ඊට පටහැනිව, හිතන්නත් තවත් අයට අයිතිය තියෙනවා. මේ විදිහට මේක චලනය වෙනවා. ඒත් මේ වගේ සංකීර්ණ ප්‍රශ්නයක් සමඟ ගණුදෙනු කරද්දී අපි හැඟීම් බර නොවී, බුද්ධිමත්ව කල්පනා කළ යුතුයි.

**ප්‍රශ්නය** : කොළඹ සිට ජිනීවා බලා යත්දී සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීම පිළිබඳ අදහසත්, ආණ්ඩුවේ නියෝජිතයන්ට තිබුණා. නමුත් සාකච්ඡාවලදි ඒක කරගන්න ආණ්ඩුවට හැකියාවක් ලැබුනේ නැහැ. අවසානයේදී පවතින සටන් විරාම ගිවිසුම ආරක්ෂා කරන්න, දෙපාර්ශවය එකඟ වුණා.

**පිළිතුර** : මෙහෙමයි. සටන්විරාම ගිවිසුමත් තිබුණාට නිතීමය වශයෙන් ඒකේ ප්‍රශ්නයක් තියෙනවාය කියලා එච්. එල්. ද සිල්වා මහත්තයා පැහැදිලි කළා. ඒ කේ එහෙම ගිවිසුමක් තියෙනවා. ඒක අපිට පිළිගන්න වෙනවා. මේකේ තියෙන අඩුපාඩුත් එක්ක යම්තාක් මට්ටමට ජනතාවට සහනයක් වන ලෙස අපිට ඒක පාවිච්චි කරන්න සිද්ධ වෙනවා. මේ සාකච්ඡාවෙන් පස්සේ ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරලා තියෙනවා. සමහරු ඒක සටන්විරාම සංශෝධනයක් වශයෙන් දකිනවා. තවත් සමහරක් අය එහෙම නෙමෙයි කියලා තියෙනවා. තවත් සමහරක් අය, මේක පැහැදිලි කිරීමක් විතරයි කියලා තියනවා. මේ විදිහට විවිධ මත ඒ ගැන තියෙනවා. ඒත් මම මේක දිහා බලන්නේ ඒ විදිහට නෙමෙයි. මම දකින විදිහට මෙතැන, රජයයි, එල්.ටී.ටී.ඊ. යයි එකඟ වුන අළුත් ලියවිල්ලත් තියෙනවා. ඒක හොඳ දෙයක්. එහෙම නැතුව මේකට අර්ථකථනයක් දීලා මේක පැහැදිලි කිරීමක්ද, ඇමිණුමක්ද, සංශෝධනයක් ද කියන එක නෙමෙයි හපන්කම. පැහැදිලිවම අපි බැලිය යුත්තේ, ප්‍රචණ්ඩත්වය අඩුකර ගැනීමට, මේ රටේ තියෙන ප්‍රශ්න නිරාකරණය කර ගන්න මේක ප්‍රවේශයක් කර ගන්න පුළුවන් ද කියන එකයි.

**ප්‍රශ්නය** : නමුත් පවතින සටන්විරාම ගිවිසුමේ කිසිම සංශෝධනයක් සිදු නොවුන බව ඇන්ටන් බාලසිංහම් බොහෝම පැහැදිලිවම කියලා තිබුණා.

**පිළිතුර** : ඒක එයාගේ අදහස. ඒත් අන්තිමට වැදගත් වෙන්නේ මේ නිවේදනය. ඒ ගැන වාද විවාද කර කර ඉන්නවාට වඩා අවශ්‍ය වෙන්නේ, මේ අළුත් නිවේදනයේ තියෙන විදිවිදාන ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක සොයා බැලීමයි.

**ප්‍රශ්නය** : සටන්විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රධානත්වය ස්වීඩනයට හිමිවුණා. මේක මහා ජයග්‍රහණයක් විදිහට ආණ්ඩුව, අර්ථකථනය කළාට ඇත්තටම මේකෙන් වුණේ, එල්.ටී.ටී.ඊ.යට ජාත්‍යන්තරිකව ගණුදෙනු කිරීමට තවත් ඉඩ ප්‍රස්ථාවක් විවරවීම විතරයි නේද?

**පිළිතුර** : මෙතැන වැරදි අවබෝධයන් ගොඩක් දෙනෙක් තුළ තියෙනවා. ස්වීඩනය නෙමෙයි, මේ වගකීම භාර අරගෙන තියෙන්නේ, ස්වීඩන් ජාතිකයෙක්. සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ සභාපති හැටියට, නෝර්වේ රජයට ඕනෑම කෙනෙකු පත්කළ හැකියි. එයා ඉංග්‍රීසි ජාතිකයෙක්, රුසියන් ජාතිකයෙක්, ඉන්දියානුවෙක් හරි වෙනත් කවුරු හරි විය හැකියි. ඒත් පැහැදිලිවම රටක් නෙමෙයි, පත් කරලා තියෙන්නේ. පත් කරලා තියෙන්නේ එක පුද්ගලයෙක් ව විතරයි. පැහැදිලිවම ස්විඩන් රට මේකට එකතු වෙලා නැහැ. නෝර්වේ රජය හරහා කෙරෙන මේ පත්වීමට ඕනෑම කෙනෙකු පත් කරන්න, ඒ අයට පුළුවන්.

**ප්‍රශ්නය** : ජිනිවා සාකච්ඡා අවසානයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී ආණ්ඩුවේ ප්‍රකාශයන් විධිමත් ලෙස හැසිරුණේ නැහැය කියලා දේශපාලන කාරණාවන් පිළිබඳ අවබෝධයක් ඇති ගොඩක් දෙනෙක් කියනවා.

**පිළිතුර** : ඔබ ඉදිරිපත් කරන්නේ මතයක් විතරයි. සාමාන්‍යයෙන්, මාධ්‍යවේදියෙක් යම්කිසි ප්‍රශ්නයක් ඇහුවාහම, ඒ ප්‍රශ්නයට උත්තරදීමේ සදාචාරාත්මක අයිතියක් තියෙනවා. එතැනදී ප්‍රශ්නය අහන විදිහටයි, උත්තර දීම කළ යුත්තේ. ඒ නිසා ඔබ මතුකරන කාරණය වැරැද්දක් විදිහට මම දකින්නේ නැහැ.

**ප්‍රශ්නය** : මේ සාකච්ඡා හරහා උතුරු නැගෙනහිර ප්‍රදේශවල ව්‍යාපාර කටයුතු කරන්න දකුණේ ආයෝ-ජකයන්ට අවස්ථාව සැලසෙනවාය කියලා ඔබ මීට පෙර මාධ්‍යයට කියලා තිබුණා. කොහොමද, ඒක වෙන්නේ.

**පිළිතුර** : ඒක සිද්ධ වෙන්න පුළුවන්. ව්‍යාපාර කටයුතු කරන්න බාධාවක් නැත්නම්, ප්‍රචන්ඩ ක්‍රියා සිද්ධවෙන්නේ නැත්නම්, දකුණේ අයට ඒ පළාත්වලට ගිහිල්ලා ව්‍යාපාරික කටයුතු කරන්න පුළුවන්. ඒක ආර්ථිකමය වශයෙන් විතරක් නෙමෙයි, සාමය අතින් බැලුවත් හොඳ දෙයක්. ඒ නිසා මොන විදිහට බැලුවත් මේ ප්‍රවේශයට අපි ඉඩ දිය යුතුයි.

**ප්‍රශ්නය** : ''මහින්ද චින්තන'' ලියවිල්ල සම්පාදනයේදී ඔබ ක්‍රියාකාරී වැඩ කොටසක් කළා. ඒ තුළින් දේශීය ආර්ථිකයත් ගොඩනැගීම පිළිබඳ ඔබලා කථා කළා. ඒ වෙනුවෙන් පසුගිය මාස කිහිපයේ ඉටුකරන ලද වැඩ කොටස පිළිබඳව ඔබට සෑහීමකට පත්වෙන්න පුළුවන්ද?

**පිළිතුර** : ඇත්තටම ඔව්. මේ රටේ ආර්ථිකයට සම්බන්ධවීමට අපි දේශීය ව්‍යාපාරිකයන්ට බොහෝදුරට අවස්ථාව දීලා තියෙනවා. කර්මාන්ත ශාලා 300 ව්‍යාපාරයට, කෘෂිකර්මය දියුණු කිරීමේ ව්‍යාපාරවලට, යටිතල පහසුකම් ප්‍රවර්ධනයට අපි උපරිම සහයෝගයක් පසුගිය කාලයේ ලබාදීලා තියෙනවා. ඒ වගේම වෙනත් රටවල් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීමේදී, දේශීය ව්‍යවසායකයන්ට හැකි උපරිමයෙන්ම අපේ සහයෝගය දීලා තියෙනවා. දේශීය ව්‍යවසායකයන්ට කිසියම් ශක්තියක් ලබා දුන්නොතින් විතරයි අපිට මේ ගමන යන්න පුළුවන්ය කියන ඒ යථාර්ථය රජයක් විදිහට අපි තේරුම් අරගෙන තියෙනවා.

**චාමර ලක්ෂාන් කුමාර**





ඕස්ට්‍රේලියාවේ මුල්ම කාන්තා සඟරාව

වරක් කියවා බලන්න.

ශ්‍රී ලාංකික වෙළඳ සැල් වලින් ලබා ගත සඟරාව

වරක් කියවා බලන්න.